**සාමාන්‍ය සමය තිස්හතරවන හෙවත් අවසාන ඉරුදින** | **දේව ප්‍රකාශන** | 22-11-15

**ක්‍රිස්තු රජාණන්ගේ මංගලෝත්සවය**

## පළමුවන දේව ප්‍රකාශනය

දානියෙල් 7:13-14

දානියෙල් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**"උන් වහන්සේගේ රාජ්‍යය කිසි කලෙක නැති නොවන්නේ ය."**

"තවදුරටත් බලා සිටිය දී මම රාත්‍රී දර්ශනවල දී මෙසේ දිටිමි. මනුෂ්‍ය-පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරාණිකයාණන් වෙත එළඹුණේ ය. උන් වහන්සේ පෞරාණිකයාණන් වෙත පමුණුවනු ලැබූ සේක. සියලු ජනයන් ද ජාතීන් ද භාෂාවන් ද උන් වහන්සේට සේවය කරන පිණිස පාලන බලය ද ගෞරවය ද රාජ්‍යය ද උන් වහන්සේට දෙන ලද්දේ ය. උන් වහන්සේගේ පාලනය පහ නොවන සදාකාලික පාලනයක් ය. උන් වහන්සේගේ රාජ්‍යය කිසි කලෙක නැති නොවන්නේ ය."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 93:1-2, 5

පිළිතුර: සමිඳාණෝ මහිමාලංකාරයෙන් සැරසී සිටින රජාණෝ ය.

ගීය: සමිඳාණෝ රජකම් කරන සේක; ජයශ්‍රීය නමැති ඉඟ පටිය බැඳ මහිමාලංකාරයෙන් සැරසී සිටින සේක. සදහට ම නොසැලෙන සක්වළ පිහිටෙවූ සේක.

ඔබේ සිහසුන ආදියේ පටන් තිරසර ව පිහිටා ඇත්තේ ය. ඔබ අනාදියේ පටන් වැඩ සිටින සේක.

සමිඳුනි, ඔබේ අණපණත් සදාතනික ය. ඔබේ දේව මාලිගාව සැබැවින් ම සදහට ම සුවිශුද්ධ ය.

## දෙවන දේව ප්‍රකාශනය

එළිදරව්ව 1:5-8

එළිදරව්ව පොතෙන් ගත් කොටසකි.

**(උන් වහන්සේ අප රාජකීය පූජක වංශයක් කළ සේක.)**

මළවුන්ගෙන් උත්ථාන වූ කුලුදුලාත්, මිහි පිට රජුන්ගේ අධිපතියාත් වන, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගෙන් ද, ඔබට කරුණාව හා ශාන්තිය වේ වා! උන් වහන්සේ අපට ප්‍රේම කරන සේක; සිය යාගික රුධිරයෙන් අප පවින් මිදූ සේක. තම පියාණන් වන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස උන් වහන්සේ අප රාජකීය පූජක වංශයක් කළ සේක. ඒ තැනැන් වහන්සේට, මහිමය ද බලපරාක්‍රමය ද සදහට ම වේ වා! ආමෙන්. බලන්න, උන් වහන්සේ වලාකුළු පිරිවරා වඩින සේක. සියල්ලෝ උන් වහන්සේ දකින්නෝ ය. කුරුසියේ ඇණ ගැසූ අය ද උන් වහන්සේ දකින්නෝ ය. මිහි පිට සියලු ජාතීහු උන් වහන්සේ නිසා වැලපෙන්නෝ ය. එය සැබෑ ම ය. ආමෙන්. "ආරම්භය ද අවසානය ද මම වෙමි"යි වැඩ සිටින, වැඩ සිටිය, මතු වඩින සර්ව පරාක්‍රම ස්වාමීන් වන දෙවියන් වහන්සේ වදාරන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

මාක් 11:9-10

ආලේලූයා! ආලේලූයා!
"අපේ පිය වූ දාවිත්ගේ මතු පැමිණෙන රාජ්‍යයට ආසිරි වේ වා!, සමිඳුන් නමින් වඩිනා මෙතුමාණන් හට ආසිරි වේ වා!, අති උසස් තැන්හි හෝසන්නා!"
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 18:33-37

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("මම රජෙක් යයි ඔබ ම කියන්නෙහි ය.")**

එබැවින් යළිත් රජවාසලට පිලාත් ඇතුළු වී, ජේසුස් වහන්සේ කැඳවා, "නුඹ ජුදෙව්වරුන්ගේ රජ දැ"යි ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්: "මෙය ඔබ ම කියන දෙයක් ද, නැතහොත් අන් අය මා ගැන කී දෙයක් දැ"යි ඇසූ සේක. පිලාත් පිළිතුරු දෙමින්, "මම ජුදෙව්වෙක් ද? නුඹේ ම ජාතිය ද නායක පූජකයෝ ද නුඹ මා අතට භාර දුන්හ. නුඹ කුමක් කෙළෙහි ද?"යි ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති නැත. මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති වූවක් නම්, ජුදෙව්වරුන් අතට මා භාර නොදෙන පිණිස මාගේ සේවකයන් සටන් කරනු ඇත. ඒ නිසා මාගේ රාජ්‍යය මෙලොවින් වූවක් නොවේ ය"යි වදාළ සේක. එවිට පිලාත්, "එසේ නම්, නුඹ රජෙක් දැ"යි උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මම රජෙක් යයි ඔබ ම කියන්නෙහි ය. මා උපන්නේත්, ලොව පහළ වූයේත්, සත්‍යයට සාක්ෂි දරන පිණිස ය; සත්‍යයෙහි පිහිටි සියල්ලෝ මාගේ හඬ අසති"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.